

ගියේය.

හිම මත සිරවී සිටිය කිහිප දෙනා වහාම හිම තුළින් එලියට විත් යට වී සිටි අය එළියට ඇද ගැනීමට සමත් විය. ඒ වෙන විටත් තවත් 08 දෙනෙකුට දිවි අහිමිව ගොස් තිබුණි.

ගුවන් යානය තුළ පැවැතියේ දැඩි නිහඬතා වකි. සියලු දෙනා සෙමින් හුස්ම ගනමින් සිටියේ ගුවන් යානය තුළ පවතින අවසන් ඔක්සිජන් ප්‍රමාණය රැක ගැනිමටයි. දින 03ක් පමණ ඔවුන් එය තුල සිර වි සිටියේය.. ආහාර සදහා ඉතිරිව තිබුනේ මිය ගිය 08 දෙනාගේ සිරුරුය. නන්දෝගේ ජිවත් වීමේ අවශ්‍යතාවය ඉහළය. ඔහු සෑම විටකම සිතුවේ මම හුස්ම ගන්නවා එනම් මම ජිවත් වෙන්න ඕන යන්නයි. ඔහු ගුවන් යානයේ යකඩ බටයක් රැගෙන හිම තට්ටුවට ඉහළින් සිදුරක් සෑදුවේ ය. එයින් යානය තුළට හඩක් ඇසෙන්නට විය. නන්දෝ නින්දෙන් අවදි විය.

ගංගාවේ අනිත් පැත්තේ මිනිසෙකු අශ්වයෙකු පිට නැගී ගමනක් යමින් සිටි අතර ඔවුන්ව දැකි එම පුද්ගලයා එතන නැවතුණි. නන්දෝ ඔහුට දැඩි හඩින් කතා කළත් එම පුද්ගලායට එය ඇසුනේ නැත. අසු පිටින් බැසි පුද්ගලයා තමන් සතුව තිබු කඩදාසියක් හා පැන්සලක් ගලක ගැට ගසා නන්දෝ සිට දෙසට විසි කලේය. නන්දෝ එහි ඔවුන්ගේ තත්ත්වයත් ගුවන් යානය වැටි සිදු වු දෙයත් උදව් අවශ්‍ය බවත් ලියා නැවත එය ගලත් සමග පුද්ගලා සිටි දෙසට විසි කලේය. එය කිය වූ පුද්ගලයා මවිතයට පත් වූ අතර ඔහු උදව් ඉල්ලාගෙන එමට පොරොන්දු විය. යාමට පෙර ඔහු ළග තිබුනු ආහාර ස්වලපය නන්දෝ සිටි ඉවුරට විසි කලේය. පසුව නන්දෝව හා ඔහුගේ සගයා සිටි තැනට හෙලිකොප්ටර් වලින් පැමිණි ගලවා ගැනිමේ පිරිසක් ඔවුන්ගේ දෙදෙනාව බේරා ගත් අතර නන්දෝගේ මග පෙන්විම යටතේ අනිකුත් පිරිස ගලවා ගැනිමට ගුවන් යානා ගියේය..

එදා 1972 දෙසැම්බර් 23 වෙනිදා දින 72ක කාලයක් ඇන්දිස් කදුවැටියේ නොදන්නා පෙදෙසක සිරව ජිවිත ගලවා ගත් ඉතිරි 16 දෙනාගේ ද ජිවිත ගලවා ගැනීමට හැකියාව ලැබුණි. දෙසැම්බර් 26 වෙනිදා සියලු පුවත්පත් වල සිරස්තල වල මේ අපුරු දිවිගලවා ගැනීම ගැන වාර්තා




වාතය පැමිණියේය. පසුදා නන්දෝ හිම කැටිය කඩාගෙන ගුවන් යානයෙන් එළියට පිවිසුණි. එයින් සියලු දෙනාම එළියට පැමිණි යේය.. පසුදා ඉතිරිව ඇති ආහාර සංචිතය බැලිමට ගිය නන්දෝට හමුවුනේ තමන්ගේ නැගණියගේ සිරුරයි. ඔහු එය වාහම එය තවත් හිම වලට යට කලේය.

නන්දෝ තීරණයක් ගත්තේ ය. ඒ ඔවුන් වැටි සිටි ප්‍රපාතය තරණය කර ගොස් උදව් සොයා ගැනිමයි. නන්දෝගේ සහයට Roberto Canessa සහ Antonio Vizintin ද පැමිණියේය.. ඔවුන් ගමන ආරම්භ කලේය. ඉතිරි පිරිස ගුවන් යානයේ ලබා ගත් කොටස් වලින් සැදූ ගුවන් විදුලියක් හරහා උදව් ලබා ගැනීමට උත්සහයක නිරතව සිටියේය.. දින ගණනාවක ගමන් නන්දෝ හා අනිත් දෙදෙනාට ඉතිරිව තිබුණි. නමුත් මගදී Antonio Vizintin ව නැවත හරවා එවන ලදී. නන්දෝ සහ ඔහුගේ සගයා දින 09ක් පමණ මීටර් 4,650 පමණ දැවැන්ත කදු වැටියක් තරණය කරමින් කදු වැටියේ අනිත් පෙදෙසට යාමට සමත් විය. ඔවුන්ගේ බලාපොරොත්තු වැඩි කරමින් කොළ පැහැ යන් ඇති තණකොල වලින් පිරි පෙදෙසක් හමුවිය. ඒ හරා කදුවැටියෙන් ගලා ආ ජල පහරකින් සෑදුනු ගංගාවක්ද විය එහි ජල පහර තරමක් වේගවත් විය. ඔවුන් විවේක ගන්නා විට නන්දෝ හට අශ්වකුර ගැටෙන වන්නට පටන් ගත්තේ ය.. බොහො දෙනා මේ පිරිසට චෝදනා එල්ල කරන්නට වුයේ දිවි ගලවා ගැනිමට ඔවුන්ගේ සගයන්ගේ සිරුරු අනුභව කර ම්ලේච්ඡත්වය පෙන් වූ බව කියමිනි. නමුත් ආගමික පිරිස් හා බොහො දෙනා මේ ඉතිරි 16 දෙනා වෙනුවෙන් ඉදිරිපත් විය. ඒදිවි ගලවා ගැනිම වෙනුවෙන් ඔවුන් කළ දේ නිවරැදි බව කිමටයි. මේ 16 දෙනා අදටත් ජිවත් ව සිටින අතර ඔවුන් ගැටුනු හදුනා නොගත් නම් නොකරන ලද කදු වැටිය නන්දෝ පැරාඩෝගේ පියා වුනු සැරරද්්ැකැර ජ්රර්ාද ගේ නමින් නම් කලේය. සියලු දෙනාට ජිවත් විමේ ආශාව ඇති කළ නන්දෝ පැරාඩෝ සියලු දෙනාගේ ගෞරවයට පාත්‍ර විය. අදටත් මේ පිරිස සෑම වසරකම අනතුර වූ දිනයේ දී එම කදු වැටියට ගොස් යානයේ ඉතිරි වූ කොටස් වලින් සෑදු ස්මාරකයට තමන්ගේ ගෞර වය දක්වන්නේ මිය ගිය සියලු දෙනා සිහි කරමිනි.

අදටත් කදු නගින්නට පවා අදහා ගත නොහැකි ඔවුන්ගේ ඇන්දිස් කදු තරණය කිරිමට සමත් වුවෙකුද නැත. මෙය ඉතිහාසයේ වාර්තා වූ දිවි ගලවා ගැනිමේ කතා අතරින් විශිෂ්ඨතම කතාව ලෙස වාර්තා අතර ඇත..

**කරුණු අන්තර්ජාලය ඇසුරිණි**




නොහඬන් ළඳුනේ
නොහඬන් ළඳුනේ...
සුරා පොදක් මා තොල ගෑ පමණින්
සුරාසොකෂකු හෙවිදෝ....?
ඇගෙ අත ගෙන රැඟුමක් පෑ පමණින්
මා සලෙලකු වේදෝ....?

එදා හැත්තෑව දශකයේ ගුවන් විදුලියෙන් නිතර ඇසුණු මේ ගීතය එකල විසූ සංගීත රසිකයනට නම් හොඳින්ම මතක ඇතුවාට කිසිදු සැකයක් නැත. අන්තිම විනෝදකාමී එහෙත් මුව පොව්වකු මෙන් අහිංසක, තාරුණ්‍ය මදක් පසුකළ පිරිමියෙකු තම බිරිඳට හෝ පෙම්වතියට තමන්ගේ නිර්දෝෂීභාවය පෙන්වීමට ගායනා කරන මෙම ගීතයේ පද වැලට ජීවය දුන් ඔහුගේ කට හඬ, මා ඉහත පැවසූ සියලුම චිත්ත රූප අපට මවා ගැනීමට අවැසි පාලම තනා දුන්නේ ඉතා විස්මිත ලෙසය. ඒ හකෂෙහි, මේ සියලුම ගුණාංග හා එම තැනැත්තාගේ ප්‍රතිරූපය පවා උලුප්පාලමින් අප ඔහුව හොඳින්ම දන්නා කියන කෙනෙකු බවට පත් කරලීමේ ඉන්ද්‍රජාලික ගුණයක් ගැබ්ව තිබිණි.

එපමණක්ද ඔහු,
බිඳුවක් ඉවසා අහන්න හිතවත,
අහන්න හිතවත,
ඈ මගෙ පෙම්වතියයි...
කිසි දා නොලබන පෙමක් පතා ඔබ
ඇය රිදවනු වැරදියි.....
ඇය රිදවනු වැරදියි.

යනුවෙන් ගයද්දී එතැන සිටියේ තම පෙම් වතියට පණ මෙන් ආදරය කරන අහිංසක පෙම්වතෙකි. ඔහුට තම පෙම්වතියගෙන් ආදරය ඉල්ලා කරදර කරන අනංගයා සමඟ සටන් වැදීමට තරම් ශක්තියක් හෝ බලයක් නොවීය. ඔහු මෙසේ ආයාචනා කරන්නේ එහෙයිනි. පුදුමය නම් ඒ සියල්ලම ඒ කට හඬේ හා ගයන විලාසයේ ගැබ් වී තිබීමයි.

එකල පමණක් නොව එදා මෙදා තුර අදටත් ප්‍රසංග වේදිකාවට නැතිවම බැරි චරිතයක් වූ මේ ගායනවේදියා පුන්සිරි සොයිසා නම් වන්නේය. ඒ කාලයේම වාගේ සංගීත ලොවට පිවිසි ප්‍රියා සූරියසේන ගායකයාණන් හා මෙතුමන්ගේ කට හඬවල රිද්මය හා තාලය යම්තාක් දුරට එක ළඟ ළඟ ගියද ඒ කට හඬ දෙකටම තිබුණේ වෙනම අනන්‍යතාවයකි. විරහවේ සහ ආදරයේ දෝංකාරයකි. හදවත විනිවිද යන බලයකි.

එදා මෙන්ම අදටත් ඒ ජනප්‍රියතාවයම රඳවාගෙන සිටින පුන්සිරි සොයිසා වැනි ගායකයන්ගේ ගීත අද වැඩිපුර ප්‍රචාරය නොවීම මහත්ම වූ අසාධාරණයකි. අද්‍යතන පරපුරේ නොලැබීමකි. කැසට් පට නිකුත් කිරීම අතින් නිහාල් නෙල්සන් ගායනවේදියාට වඩා මදක් පසු පසින් සිටියද පුන්සිරි සොයිසාද නිර්මාණය කළ ගීත කැසට් පටද රාශියකි.

පුන්සිරි සොයිසා ගැයූ ල එගොඩත් මෙගොඩත් ගම් යා කරලා ල ගීතය ඔබට මතකද? එය ල ඉංජිනේරුවන්ගේ ගීතයල නමින් බොහෝ අය හැඳින් වූහ.

එපමණක්ද,
සුභා කියා මා ඔබ අමතන්නද
ස්වර්ණමාලී ලෙස ඔබ අමතන්නද
මට නම් නොහැඟෙන්නේ..
කොහොම ඇමතුවත්
ඒහා සැසැදෙන ඔබේ නමින්
බවය පුරා මා ජීවත් වන්නේ... යන මේ පද වැල් ඔහු ගයන්නේ හදවත අතේ තියාගෙනය. එතරම්ම ඒ හඬ එවිට ප්‍රේම□යය.

එලෙසින්ම ඔහු,
සෙව්වන්දියකට පෙම් බැන්ඳා
අසා දහසක් රස වින්ඳා..
නටු අග කටු මත කටුක බව දැනී
හදවත පාරයි වේදනා..

යනුවෙන් හා
මේ බස් නැවතුම පෙර හැම දිනකම
අප හමුවුන හැටි දැන උන්නේ
මා තනිවුණු බව ඔබ සමුගෙන බව
බස් නැවතුම තව නෑ දන්නේ...

යනුවෙන් ගැයුවේ ඔහු හඬමින් නොවේ. එහෙත් ඒ ගායනයන් අසා අප හැඬුවෙමු. ඒ හඬ අපව හැඬවීය. එය අදටත් එසේමය. එයයි එහි ඇති විශේෂත්වය.

දනන් තුඩ තුඩ රැව් දෙන වසර 30 ක් හෝ 50 ක් පැරණි මෙවන් ගීත මෙන්ම එතුමා අදටත් නවතම ගීත නිර්මාණය කරන්නේය. අදටත් ප්‍රසංග වේදිකාවල ගයන්නේය. ජනතාවගේ හදවත් තුළ වසන්නේය.

අද වෙසෙන තරුණ පරපුරට මෙතුමන්ලා වැනි ගායනවේදීන් අමතකව ගියද අපගේ හදවත් වල නම් සදහටම ජීවමානය. මේ පුංචි සටහන පුන්සිරි සොයිසා නම්වූ ඒ අහිංසක හා ප්‍රේමනීය හඬක් ඇති ගායකයාට උපහාරයක් පිණිසය. එතුමන්ව තරුණ පරපුරට සිහිපත් කර දීමටය.

එතුමන් අප එදා ඇසූ ඒ කට හඬින්ම අදත් ගයන්නේය. හෙටත් එලෙසින්ම ගැයීමට හැකිවේවායි යන්න අප සැමගේම හෘදායාංගම ප්‍රාර්ථනය වන්නේය.

